# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2077/33 - 2018 ජුනි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස - (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1979 අංක 51 දරන වරාය අධිකාරිය පනත**

දැන්වීමයි

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ දෙවන (2) වගන්තියේ තුන්වන (3) උප වගන්තිය ප්‍රකාරව, වරාය හා නාවික අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගය.

**මහින්ද සමරසිංහ,**
වරාය හා නාවික කටයුතු අමාත්‍ය.

2018 ජුනි මස 21 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

ගාල්ල වරාය මේ සමග ඇති උපලේඛනයේ දක්වා ඇති සීමාවන් ඇතුළත වූ ප්‍රදේශය විය යුතු ය.

උපලේඛනය

***උතුරට:-*** අක්ෂාංශ $06^0$ 03' 24.5" සහ දේශාංශ $80^0$ 10' 36.4" හි පිහිටි ඒ ලක්ෂයෙන් (ගිංතොට ලක්ෂය) ඇරඹී නැගෙනහිර දෙසට ඉහළ ජල රේඛාව දිගේ මහ මෝදර ඇළ හරහා ගොස් යළිත් ඉහළ ජල රේඛාව දිගේ කැපූ ඇළ හරහා ගොස් යළිත් ඉහළ ජල රේඛාව දිගේ ගාල්ල කොටුවේ (කොටු පවුර) බටහිර සහ දකුණු සීමාව දිගේ ප්‍රදීපාගාර පරිශ්‍රයේ (මුපි (ගා) 2384 කැබලි අංක 8 හි) බටහිර සහ උතුරු සීමා හරහා නැවත ගාල්ල කොටුවේ (කොටු පවුර) නැගෙනහිර සීමාව දිගේ වරාය සංචාරක බංගලාව පරිශ්‍රයේ (මුපි (ගා) 2384 හි කැබලි අංක 9 හි) දකුණ, බටහිර හා උතුරු සීමාව හරහා නැවත කොටු පවුරේ නැගෙනහිර සීමාව දිගේ මුපි (ගා) 2384 හි කැබලි අංක 7 හි දකුණු කොටු පවුර සීමාව දිගේ සහ බාල දක්ෂ මාවතේ නැගෙනහිර හා උතුරු මායිම දිගේ ගොස් රජයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ නැගෙනහිර සහ උතුරු පරිශ්‍ර සීමාවන් දිගේ නැවත ඉහළ ජල රේඛාව දිගේ උතුරට සහ මාර්ගයට (සමුද්‍ර මාවත) දකුණින් පිහිටි ඉහළ ජල රේඛාව දිගේ සමුද්‍ර මාවත පිහිටි කේන්ද්‍රික පහන් කණුව පිහිටි පරිශ්‍රයේ බටහිර සහ උතුරු සහ නැගෙනහිර සීමාව හරහා ගොස් නැවත ඉහළ ජල රේඛාව දිගේ ගොස් ධීවර දියකඩනය ඇතුළත්ව ධීවර වාරයෙහි බටහිර


1A - G 27955 - 12 - (2018/06)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ*

සහ දකුණු සිමාවන් දිගේ මොරගොඩ ඇළ හරහා මොරගොඩ ඇලේ ගිනිකොණ හා නැගෙනහිර කෙලවර දිගේ මාතර මහා මාර්ගයේ දකුණු සීමාව හමුවන ලක්ෂයේ සිට මාර්ගය දිගේ ගිබට් පටුමගෙහි බටහිර සීමාව දක්වා ගොස් ගිබට් පටුමගෙහි බටහිර සහ දකුණු සීමාව දිගේ ක්ලොස්ම්බර්ග් පාර දක්වා සහ ක්ලෝසම්බර්ග් පාරේ බටහිර මායිම දිගේ දකුණු දිශාවට ගොස් වරාය ප්‍රධාන පිවිසුම උතුරු මායිම දක්වා සහ ක්ලොසම්බර්ග් පාර හරහා මුපි (ග) 167 හි කැබලි අංක 7 හා 11 සහ මුපි (ගා) 2285 හි කැබලි අංක 1 සහ 2 හි දකුණු මායිම (මුපි (ගා) 2384 හි කැබලි අංක 4හි උතුරු මායිමේ කොටසක්) දිගේ බී. ආර්. දිසානායක විසින් හිමිකම් කියනු ලබන බඩලෙවත්ත *හෙවත්* අබරංගේවත්තෙහි (වරිපනම් අංක 404, මාතර පාර) නැගෙනහිර මායිම දිගේ (මුපි (ගා) 2384 හි කැබලි අංක 3 ½, 3 2/2 බටහිර මායිම) ගාල්ල මාතර පාර හරහා උතුරු දෙසට මුපි (ගා) 311 හි කැබලි අංක 13, 11, 7, 14, 6 සහ 1 හි නැගෙනහිර මායිම වඩුගේ වත්තෙහි (වරිපනම් අංක 14/10/2, සුධර්මාරාම පාර) නැගෙනහිර මායිම බී. ආර්. දිසානායක හා තවත් අය විසින් හිමිකම් කියනු ලබන ස්කානිගේ වත්ත *හෙවත්* නොතාරිස් වත්ත (වරිපනම් අංක 14/10/32, සුධර්මාරාම පාර) නැගෙනහිර මායිම ඒ. එච්. සිරිපාල හා තවත් අය විසින් හිමිකම් කියනු ලබන රුබීගේ වත්ත (වරිපනම් අංක 11/6, සුධර්මාරාම පාර) නැගෙනහිර මායිම බී. ආර්. දිසානායක සහ හා තවත් අය විසින් හිමිකම් කියනු ලබන නොතාරිස්ගේ වත්ත (වරිපනම් අංක 14/7, සුධර්මාරාම පාර) නැගෙනහිර මායිම ඒ. එච්. සිරිපාල හා තවත් අය විසින් හිමිකම් කියනු ලබන රුබීගේ වත්ත *හෙවත්* ජුවන් බඩකුරුගේ වත්ත (වරිපනම් අංක 14/6, සුධර්මාරාම පාර) නැගෙනහිර මායිම සහ එච්. එල්. එංගල්නෝනා විසින් හිමිකම් කියනු ලබන මුදියන්සේගේ වත්තේ (වරිපනම් අංක 14/5 සුධර්මාරාම පාර) නැගෙනහිර සහ දකුණු මායිම දිගේ (මුපි(ගා) 2384 හි කැබලි අංක 2 ½, 2 2/2 හා 1 බටහිර මායිම) සහ මුපි 4014 හි කැබලි අංක ටී 415, ඩබ් 415 සහ වයි 415 හි බටහිර මායිම සහ කේ. පද්මා පෙරේරා විසින් හිමිකම් කියනු මද්දගේ වත්තේ (වරිපනම් අංක 14/10/1, සුධර්මාරාම පාර) බටහිර මායිම බී. ආර්. දිසානායක හා තවත් අය විසින් හිමිකම් කියනු ලබන ස්කානිගේ වත්ත හා පැලවත්ත (වරිපනම් අංක 14/10/2, සුධර්මාරාම පාර) බටහිර මායිම (මුපි (ගා) 2384 හි කැබලි අංක 1 හි නැගෙනහිර මායිම) මුපි (ගා) 311 හි කැබලි අංක 6 හි බටහිර මායිම, එස්. එච්. ප්‍රේමවතී විසින් හිමිකම් කියනු ලබන මුල්ලේවත්ත (වරිපනම් අංක 323/15, මාතර පාර) බටහිර මායිම, මුපි 431හි කැබලි අංක 1හි බටහිර මායිම සහ බඩල් ඇල හරහා ඩී.ඇස්. අමරසූරිය විසින් හිමිකම් කියනු ලබන ලොවිගහවත්ත *හෙවත්* ඇලබද්ද වත්තෙහි ( වරිපනම් අංක 293, මාතර පාර) බටහිර මායිම දිගේ ( මුපි(ගා) 2384 හි කැබලි අංක 2 ½, 2 2/2 නැගෙනහිර මායිම) ගාල්ල මාතර පාර හරහා ඩී. බී. රන්ට් සිල්වා හා තවත් අය විසින් හිමිකම් කියනු ලබන ලොවිගහවත්තේ (වරිපනම් අංක 402, මාතර පාර) බටහිර මායිම පිහිටි නගරසභා සිමෙන්ති කාණුවේ බටහිර මායිම දිගේ (මුපි (ගා) 2384 හි කැබලි අංක 3 ½, 3 2/2 හි නැගෙනහිර මායිම) ඉහළ ජල රේඛාව දිගේ හමුවන ලක්ෂය දක්වා සහ ඉහළ ජල රේඛාව දිගේ බටහිර දෙසට හා මුපි (ගා) 2384 හි කැබලි අංක 4 හි නැගෙනහිර මායිම දිගේ පී. බී. අබේවර්ධන විසින් හිමිකම් කියනු ලබන බෙලිකන්දෙහි (වරිපනම් අංක 11, ක්ලොසම්බර්ග් පාර) උතුරු හා බටහිර, දකුණු මායිම් දිගේ සහ එතැනින් ඊසාන දෙසට දෙවට, ගාල්ල මාතර මාර්ගයට සමාන්තරව පිහිටි ඉහළ ජල රේඛාව දිගේ ගොස් වක්ගල්මෝදර ඇල හරහා ඉහළ ජල රේඛාව දිගේ දකුණු දෙසට සහ මුපි (ගා) 2384 හි කැබලි අංක 5 හි සහ මුපි 2491 හි කැබලි අංක එම් 253 හි උතුරු මායිම දිගේ හා එතැනින් ඒ. එච්. එම්. අයිලම් සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන රුමස්සල කන්දෙහි නිරිත දිග මායිම සහ එතැනින් පාර දක්වා සහ

***නැගෙනහිර:-*** එකී පාර හරහා මුපි 2491හි කැබලි අංක එම් 253, කිව් 253 හි බටහිර මායිම ඒ. එච්. එම්. අයිලම් විසින් හිමිකම් කියනු ලබන කැබලි අංක පිපි 24135 හි (රුමස්සල කන්ද) බටහිර මායිම දිගේ සහ මුපි 5095 හි කැබලි අංක එස් 570 හි උතුරු මායිම , මුපි (ගා) 210හි කැබලි අංක 1 හි උතුරු මායිම සහ එතැනින් මුපි (ගා) 210හි කැබලි අංක 1හි බටහිර මායිම මුපි 5095 හි කැබලි අංක එස් 570 ( රුමස්සල කන්ද, බොනවිස්ටා කන්ද) රජයේ ඉඩම හි බටහිර මායිම, කොළඹ බිෂොප්තුමා විසින් හිමිකම් කියනු ලබන පල්ලිය වත්ත (පිපි 60814) හි බටහිර මායිම, සහ මුපි 1993 හි කැබලි අංක 1හි බටහිර මායිම සහ වොලිටර් රූපසිංහ සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන පිපි (ගා) 69109, (නාකන්දෙනිය හේන කටුබැද්ද වත්ත, හේනේ ගෙදර වත්ත) හි බටහිර මායිම හා එම ඉඩමේ දකුණු මායිම සහ රුමස්සල (ගම්සභා) පාරෙහි බටහිර මායිම දිගේ ගිනිකොණ දෙසට සාම චෛත්‍ය හන්දිය දක්වා සහ එතැනින් රුමස්සල පාරෙහි උතුරු මායිම දිගේ බටහිරට සහ පාර හරහා මාර්ග රක්ෂිතයේ බටහිර මායිම දිගේ සහ අනතුරුව ඉහළ ජල රේඛාව දිගේ අක්ෂාංශ $6^0$ 00' 20.3" සහ දේශාංශ $80^0$ 14' 38.8" හි පිහිටි B නැමැති උණවටුන ලක්ෂය දක්වා සහ එම ලක්ෂයේ සිට දළ වශයෙන් නාවික සැතපුම් 7ක් දකුණට අක්ෂාංශ $5^0$ 53' 15.8" සහ දේශාංශ $80^0$ 14' 38.8" හි පිහිටි C ලක්ෂය දක්වා ඇදි රේඛාවකින් හා

***දකුණට:-*** ඉහත C ලක්ෂයේ සිට දළ වශයෙන් නාවුක සැතපුම් 5ක් වයඹ දෙසට අක්ෂාංශ $05^0$ 56' 19.3" හා දේශාංශ $80^0$ 10' 36.5" පිහිටි D ලක්ෂය දක්වා ඇදි රේඛාවෙන් සහ

***බටහිරට:-*** D ලක්ෂයේ සිට දළ වශයෙන් නාවුක සැතපුම් 7ක් දකුණට එතැනින් ඉහත D ලක්ෂයේ සිට දළ වශයෙන් නාවික සැතපුම් 7ක් උතුරට අක්ෂාංශ $6^0$ 03' 24.5" සහ දේශාංශ $80^0$ 10' 36.4" හි පිහිටි A නැමති ගිංතොට ලක්ෂය දක්වා ඇදි රේඛාවකින් සීමාවූ ගොඩබිම් හා මුහුදු ප්‍රදේශය.

***සටහන : -*** 1. දක්වා ඇති ලක්ෂයන් WGS-84 ඛණ්ඩාංක වන අතර, ජාතික කොටු සැලැස්මට( SLD-99) යොමුවේ.

2. A, B, C සහ D ලක්ෂ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එස්. ආර්. ඉලේපෙරුමාච්චි විසින් පිළියෙළ කළ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි අංක ඕපී/එස්/279 සහ 05.01.2018 දාතම දරන පිඹුරු පතේ දක්වා ඇත.

07 - 374

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.